ONE-TEXT INITIATIVE
trust. platform. dialogue. options.

2026 ජනවාරි 21

ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

ගරු ජනාධිපතිතුමනි,

**<u>ශ්‍රී ලංකාව සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමේදී සියලු දෙනා ඇතුළත්, විනිවිද සහ සහභාගීත්ව ක්‍රියාවලියක් සහතික කිරීම</u>**

ශ්‍රී ලංකාව සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වා දීම සඳහා ජාතික ජන බලවේගයේ මැතිවරණ ප්‍රකාශනයේ අවධාරණය කර තිබීම අපි අගය කරමු. එවන් කැපවීමක් සහිත ආණ්ඩුවක් පැවතීම ශ්‍රී ලංකාව තුළ ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ ආධිපත්‍යය සහ ජාතික සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමට ලැබුණු ඓතිහාසික අවස්ථාවක් බව අපගේ විශ්වාසයයි. එමෙන්ම, පුනරුද යුගයක් ගොඩ ගැනීම සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කර ගැනීම අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතාවයක් බව ද අපි තරයේ විශ්වාස කරමු.

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කර ගැනීම ශ්‍රී ලංකාවට තීරණාත්මක අභියෝගයක් වන අතර, එය සෑම ජන කොට්ඨාසයකයක්ම නියෝජනය වන ව්‍යවස්ථාමය දැක්මක් මත ගොඩනගා ඇති බව සහතික කිරීම අනාගත ව්‍යවස්ථාවක සාර්ථකත්වය සඳහා අත්‍යවශ්‍ය සාධකයකි. මෙම උත්සාහයේදී, සැබෑ අභියෝගයක් වන්නේ සියලු දෙනා ඇතුළත් කරගත් සහ සියලු දෙනාගේ සහභාගීත්වය තහවුරු වන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් සහතික කිරීමයි. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය ඉතිහාසය පුරාවටම එවැනි ක්‍රියාවලියක් යොදා නොගැනීම හේතුවෙන් මෙතෙක් සිදු කරන ලද සියලු ව්‍යවස්ථා සංශෝධනවල සුජාතභාවය පිළිබඳ පැහැදිලි ගැටළු මතු වී තිබේ.

1978 වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසිඑක් වතාවකට වඩා සංශෝධනය කර ඇති අතර, බොහෝ විට එම සංශෝධන පුරවැසියන්ගේ අභිලාෂයන් පිළිබිඹු කිරීමට වඩා පාලක දේශපාලන ප්‍රභූන්ගේ අවශ්‍යතා ඉටු කිරීම සඳහා සිදු කර ඇති බව පැවසීම

Address: 18A Silva Lane, Rajagiriya, Sri Jayawardenepura
Phone: 0112 860 785
Email: admin@onetext.org
web: www.onetext.org

වඩා නිවැරදිය. එනයින්, 17, 19 සහ 21 වැනි සංශෝධන කිහිපයක් පමණක් ආණ්ඩු බලය ජනතාවට සමීප කිරීමට උත්සාහ කර ඇති අතර, ඔබේ පක්ෂය සැමවිටම මෙම ප්‍රගතිශීලී ප්‍රතිසංස්කරණ සඳහා සහාය දක්වා ඇති බවද සිහිපත් කරමු.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ස්ථාවර හා සුජාත වීමට නම්, එයට ජනතාවගේ විශ්වාසය තිබිය යුතුය. එබැවින්, ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය එහි අන්තර්ගතය තරම්ම වැදගත් වේ. මෙම සුජාතභාවය සහ ස්ථාවරත්වය සහතික කිරීම සඳහා සියලු ම පාර්ශව ඇතුළත්, විනිවිද පෙනෙන ජනතා උපදේශන ප්‍රවේශයක් අත්‍යවශ්‍ය වන අතර, එය සමස්ත ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ සාර්ථකත්වයට බලපාන කේන්ද්‍රීය සාධකයක් වනු ඇති බව අපගේ විස්වාසයයි.

සියලු ජන කණ්ඩායම්, සමාජ ස්ථරයන්, පාර්ශවකරුවන් නියෝජනය කෙරෙන ව්‍යවස්ථා කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියක් අනුගමනය කිරීමේ මෙම උත්සාහයේදී, ශ්‍රී ලංකාවේ ඓතිහාසික පූර්වාදර්ශ සහ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත් කිරීමේදී ලෝකයේ හොඳම භාවිතයන් යන ද්විත්වයම සලකා බැලීමට අපි යෝජනා කරමු. එහිදී මැතිවරණයේදී ලබාගත් නිශ්චිත ජනවරමක් මත පදනම්ව නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සඳහා ස්වදේශීය රාමුවක් ස්ථාපිත කළ 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 'ස්වදේශීය ආකෘතිය' විශේෂ වෙයි. ශ්‍රී ලංකාවට අදාළ වන තවත් ආකෘතියක් ලෙස 2016 කොලොම්බියානු සාම ගිවිසුම පිළිබඳ ක්‍රියාවලිය සැලකිය හැකිය. එහිදී පුළුල් ලෙස සකසා ගත් ව්‍යවස්ථා රාමුව සහ එහි මූලිකාංග ජනතාවගේ සාකච්ඡාවට බඳුන් කොට ජනමත විචාරණයකින් සම්මත කර ගන්නා ලදී.

මෙම අත්දැකීම් සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකාවේ සමාජ-දේශපාලන සන්දර්භයට ගැලපෙන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ආකෘතියක් අනුගමනය කිරීමේ ශක්‍යතාව සලකා බලන මෙන් අපි යෝජනා කරමු. ඒ අනුව, පහත ක්‍රියාකාරකම් ඔබ වෙත යෝජනා ලෙස ඉදිරිපත් කරමු:

1. ශ්‍රී ලංකාව සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව සිදු කිරීම සඳහා අදාළ රජයේ බලධාරීන් සමඟ කටයුතු කරන, සියලු පාර්ශව නියෝජනය වන පරිදි බහු පාර්ශවීය කාර්ය සාධක බලකායක් ස්ථාපිත කිරීම. එකී කාර්ය සාධක බලකාය 1995-2000 සහ 2015-18 යන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලීන් මත පදනම් ව කටයුතු කිරීම යෝග්‍ය වනු ඇත.

2. අනාගත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පදනම් කර ගන්නා මූලික ව්‍යවස්ථාමය මූලධර්ම රාමුවක් ගොඩනැගීම සඳහා පුළුල් පදනමක් සහිත, කිසිවකු මඟ නොහැරෙන පරිදි සියළු දෙනා නියෝජනය වන පුළුල් මහජන උපදේශන ක්‍රියාවලියක් ආරම්භ කිරීම.

3. මහජන උපදේශන ක්‍රියාවලියේ ප්‍රතිඵල මත පදනම්ව, බැඳීමක් නොමැති ජනමත විචාරණයකින් අනුමත කිරීම සඳහා ව්‍යවස්ථාමය මූලධර්ම රාමුවක් කෙටුම්පත් කිරීම,

4. ජනතාව විසින් අනුමත කරන ලද ව්‍යවස්ථාමය මූලධර්ම මත පදනම්ව ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීම සඳහා දේශපාලන පක්ෂ, විද්වතුන්, සිවිල් සමාජය, සමාජ විද්‍යාඥයින් සහ නීති විශේෂඥයින්ගෙන් සමන්විත යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. මෙම යාන්ත්‍රණය බිම් මට්ටමේ මහජන අදහස් ඇතුළත් කිරීම සඳහා උපදේශන සංසද සහ ඩිජිටල් වේදිකා භාවිතා කිරීමෙන් පුළුල් මහජන සහභාගීත්වයක් සහතික කිරීමට දිරි ගැන්විය යුතුය.

5. ජනතාව විසින් අනුමත කරන ලද ව්‍යවස්ථාමය මූලධර්ම මත පදනම්ව පනත් කෙටුම්පතක් කෙටුම්පත් කිරීම

6. දැනට පවත්නා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නියම කර ඇති පරිදි, ශ්‍රී ලංකාව සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කර ගැනීම සඳහා පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක අනුමැතිය සහ ජනමත විචාරණයකින් සම්මත කරවා ගැනීම ද ඇතුළත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් අනුගමනය කිරීම.

ඔබතුමන්ගේ රජය දැනටමත් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යෝජනා කරමින් "පොහොසත් රටක්- ලස්සන ජීවිතයක්" යන මැතිවරණ ප්‍රකාශනය අනුමත කර ඇති බැවින්, ඉහත විස්තර කර ඇති පරිදි ඇතුළත්, විනිවිද පෙනෙන සහ සහභාගීත්ව ප්‍රවේශයක් අනුගමනය කිරීමෙන්, ඔබගේ නායකත්වය යටතේ මෙම රජයේ ධුර කාලය තුළ ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය සාර්ථකව නිම කළ හැකි බව අපි විශ්වාස කරමු.

එමෙන්ම ඔබතුමන් විසින් ඉදිරියේ අරඹනු ඇතැයි විශ්වාස කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට සහය දක්වනු වස් ‘ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

ක්‍රියාවලිය' පිළිබඳව සබුද්ධිමය කතිකාවක් One-Text Initiative ආයතනයේ මූලිකත්වයෙන් අප විසින් මේ වනවිට ආරම්භ කර ඇතිබව කාරුණිකව දන්වා සිටිමු.

ඒ අනුව එම කතිකාමය ක්‍රියාවලිය යටතේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සඳහා පෙනී සිටින විද්වතුන්, සිවිල් හා දේශපාලන සංවිධාන ක්‍රියාකාරීන් සහ පුරවැසියන් යන සියලු පාර්ශව වල අදහස් ඒකරාශී කොට බුද්ධිමය කතිකා මාලාවක් පැවැත්වීමටත් එමඟින් අවසාන ප්‍රතිඵලය ලෙස ලැබෙන වාර්තාව ඔබතුමන්ගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය වඩා ප්‍රශස්ත කරනු වස්, ඔබතුමන්ගේ කාරුණික අවධානය පිණිස යොමු කිරීමටත් ඉදිරියේ දී අප විසින් කටයුතු කරන බව වැඩිදුරටත් දන්වා සිටිමු.

ස්තූතියි,

මේ වගට,

One-Text Initiative ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කතිකාව වෙනුවෙන්,

අධිනීතිඥ ලාල් විජේනායක

මහාචාර්ය ප්‍රියංග දුනුසිංහ

ආචාර්ය අතුලසිරි සමරකෝන්

නීතිඥ රවින්ද්‍රනාත් දාබරේ

නීතිඥ විරංජන හේරත්

Address: 18A Silva Lane, Rajagiriya, Sri Jayawardenepura
Phone: 0112 860 785
Email: admin@onetext.org
web: www.onetext.org

ONE-TEXT INITIATIVE
trust. platform. dialogue. options.

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධම්ම දිසානායක

නීතිඥ ඒ. එම්. ෆායිස්

නීතිඥ ශිරාල් ලක්තිලක

මහාචාර්ය චරිත හේරත්

ආචාර්ය (නීතිඥ) නිමල්කා ප්‍රනාන්දු

කරුණාරත්න පරණවිතාන

නීතිඥ සමන් සේනාධීර

නීතිඥ ජනක රණතුංග

Address: 18A Silva Lane, Rajagiriya, Sri Jayawardenepura
Phone: 0112 860 785
Email: admin@onetext.org
web: www.onetext.org